# 2.23 ලාංකීය බුද්ධ ප්‍රතිමාවල හමුවන නව මුද්‍රාවක්

මාලිංග අමරසිංහ
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

පුරාතන මානව කෘති අතර බුද්ධ ප්‍රතිමාවට හිමි වන්නේ වැදගත් තැනකි. ලෝකයේ නොයෙක් රටවල නොයෙක් ආකාරයෙන් මූර්තිමත් වූ බුද්ධ ප්‍රතිමාව තරම් වෙනත් මානව රූපයක් ඇද්ද යන්න සිතීම පවා දුෂ්කරය. මෙසේ නිර්මාණය වූ ප්‍රතිමාවන්හි දැතෙහි කිසියම් මුද්‍රාවක් යෙදීම සාමාන්‍ය සිරිත වුවත් බුද්ධ ප්‍රතිමා සඳහා එසේ යොදා ගැනුනේ ඉතා සීමිත මුද්‍රා ප්‍රමාණයකි. මෙම සීමිත මුද්‍රා ප්‍රමාණය වුව ද විවිධ රටවල, විවිධ සංස්කෘතීන් හා සම්ප්‍රදායන්හි අඩු වැඩි වශයෙන් ජනප්‍රිය වී තිබේ. ලාංකික ප්‍රතිමා සඳහා ද එවැනි ජනප්‍රිය මුද්‍රා භාවිත කර ඇතත් මෙරට බුද්ධ ප්‍රතිමා විෂයයෙහි අතිශය දුර්ලභ මුද්‍රාවන් කිහිපයක් ද දක්නට පිළිවන.

ඒ අතර ඉන්දියාව ඇතුළු ආසියාතික රටවල නිර්මාණය කළ බුදු පිළිම සඳහා බහුල ව භාවිත වූ ධර්මචක්‍ර මුද්‍රාවෙන් බුදුන්වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශන අවස්ථාව නිරූපණය කරයි. ලක්දිව බුදුපිළිම අතර එය ජනප්‍රිය නොවුවක් බැවින් එවැනි බුදු පිළිම සොයා ගැනීමට පවා දුෂ්කර විය. එහෙත් මෑත කාලයේ කරන ලද පර්යේෂණ අනුව අනුරාධපුර අභයගිරි පරිශ්‍රයෙන් හමුවූ ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුතු එවැනි අතිශය දුර්ලභ බුද්ධ ප්‍රතිමා කිහිපයක් පිළිබඳ ව හඳුන්වා දීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි.